ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

இலங்கை இணக்கப்பாட்டுப் பணியகம்

SRI LANKA CONVENTION BUREAU

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2021

SRI LANKA
CONVENTION BUREAU

වාර්ෂික වාර්තාව 2021

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

SRI LANKA
CONVENTION BUREAU

පටුන

05
දැක්ම

05
මෙහෙවර

06
අරමුණු

07
සංයුක්ත තොරතුරු

09
සභාපතිතුමියගේ පණිවිඩය

10
විධායක සාරාංශය

11
2021 වර්ෂයේ ජයග්‍රහණ

11 - 15
1. පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු

15 - 19
2. අළෙවිකරණය

20
3. මානව සම්පත් සහ පරිපාලනය

20
4. අභ්‍යන්තර විගණන

21
5. එකතු කළ ආර්ථික අගය පිළිබඳ ප්‍රකාශනය

22 - 33
6. 2021 මූල්‍ය ප්‍රකාශන

34
විගණකාධිපතිවරයාගේ වාර්තාව



ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ

දැක්ම

"MICE සංචාරක ව්‍යාපාරය (රැස්වීම්, දිරිගැන්වීමේ සංචාර, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ වැඩසටහන්) සඳහා ආසියාවේ වඩාත්ම ඉල්ලුමක් සහිත ස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම"



ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ

මෙහෙවර

"ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය MICE සංචාරක ව්‍යාපාරය තුළින් ප්‍රශස්ත විදේශ විනිමය ආදායමක් උපයනු ඇති අතර එමඟින් ශ්‍රී ලංකාවේ රැස්වීම් කර්මාන්තයේ නිරතවන්නන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම තුළින් ජාතික ආර්ථිකයට දායක වීම"

අරමුණු

2005 අංක 38 දරන සංචාරක පනත මඟින් නියම කරන ලද කාර්යාංශයේ අරමුණු (පිටුව 32-33) පහත පරිදි වේ.

- අන්තර්ජාතික, කලාපීය හා දේශීය සම්මේලන, රැස්වීම් හා ප්‍රදර්ශන පැවැත්වීමේ ස්ථානයක් ලෙස සහ දිරිගැන්වීමේ සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම.
- අන්තර්ජාතික, කලාපීය හා දේශීය සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන පැවැත්වීමේ ස්ථානයක් ලෙස සහ දිරිගැන්වීමේ සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව සම්බන්ධීකරණය වූ සහ සහයෝගී සංවර්ධනය කිරීම සහ අළෙවිකරණය කිරීම සහතික කිරීම සඳහා නිර්මාණය කරන ලද පොදු ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.
- අන්තර්ජාතික, කලාපීය හා දේශීය සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන සහ දිරිගැන්වීමේ සංචාරයන් සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශය විසින් සිදු කරනු ලබන ප්‍රවර්ධනය, සංවර්ධනය සහ සේවා සැපයීම සම්බන්ධීකරණය කිරීම සහ සහාය වීම.
- සම්මන්ත්‍රණ, රැස්වීම් සහ ප්‍රදර්ශන සාර්ථකව පැවැත්වීම සහ දිරිගැන්වීමේ සංචාරක වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා දේශීය සහ විදේශීය සම්මේලන, ප්‍රදර්ශන සහ දිරිගැන්වීමේ සංචාරක සංවිධානයන් සමග සම්බන්ධීකරණය කිරීම හා සහයෝගීව කටයුතු කිරීම.
- සම්මුති, රැස්වීම්, ප්‍රදර්ශන සහ දිරි ගැන්වීමේ සංචාර සම්බන්ධ විවිධ අංශ හැසිරවීමෙහි නිරතව සිටින පුද්ගලයන් හෝ සංවිධාන විසින් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම නිර්දේශ කිරීම හා බලාත්මක කිරීම.
- සම්මන්ත්‍රණ, රැස්වීම්, ප්‍රදර්ශන සහ දිරිදීමනා ගැන්වීමේ සංචාර හැසිරවීමේ නිරතව සිටින විවිධ කාණ්ඩවල පුද්ගලයන්ගේ හෝ සංවිධානවල වෘත්තීය කුසලතා වර්ධනය කිරීම උනන්දු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ දිරිගැන්වීමේ සංචාරයන් සංවර්ධනය කිරීම හෝ ප්‍රවර්ධනය කිරීමේ යෙදී සිටින ඕනෑම සංවිධානයක් හෝ ආයතනයක් සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම, සාමාජිකත්වය ලබා ගැනීම හෝ කවර හෝ ගිවිසුමකට එළඹීම.
- ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශයන්හිද සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා අළෙවිකරණය කිරීම සඳහා කාර්යාංශයට මාර්ගෝපදේශ සැපයීම.
- ආගන්තුක සත්කාර කර්මාන්තය ඇතුළුව ප්‍රමාණවත්, ආකර්ශනීය සහ කාර්යක්ෂම සංචාරක සේවාවන් තිරසර ලෙස සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- කාර්යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික හෝ එහිලා සම්බන්ධ සියලු ක්‍රියා සහ දේවල් ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් කවර හෝ ස්ථානයක සිදු කිරීම.

සංයුක්ත තොරතුරු

ශ්‍රී ලංකාව, MICE සංචාරක ව්‍යාපාර එනම් රැස්වීම්, දිරිගැන්වීමේ සංචාර, සම්මන්ත්‍රණ සහ සම්මේලන සහ ප්‍රදර්ශන (පසුව සමහර අවස්ථාවලදී වැඩසටහන්ද එකතු කරන ලදි) සඳහා ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය (SLCB) 1987 දී ඇපකර සමාගමක් ලෙස ආරම්භ කරන ලද අතර එවකට සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

2005 අංක 38 දරන අවසන් සංචාරක පනත යටතේ ඇපකර සමාගම අහෝසි කර මෙම ආයතනය ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් කරන ලදී. සංචාරක සංවර්ධන බද්දෙන් සහ ගුවන් තොටුපළ බද්දෙන් ලැබෙන 4% ක ආදායමක් සහිතව රජයේ වාර්ෂික අයවැයක් සමඟ බක්ර ක්‍රියාත්මක වේ.

නම : ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය.

නීතිමය ආකාරය : 2005 අංක 38 දරන අවසන් සංචාරක පනත යටතේ සංස්ථාගත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි

ප්‍රධාන කාර්යාල ලිපිනය : 78, ගාලු පාර, කොළඹ 03.

විගණකවරුන් : ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා

බැංකුකරුවන් : ලංකා බැංකුව

කළමනාකරණ මණ්ඩලය

නම	කාලසීමාව	සංවිධානය
කිමාලි ප්‍රනාන්දු මිය	2021.01.01 - 2021.12.31	සභාපතිනිය - SLCB
සුනිල් දිසානායක මහතා	2021.01.01 - 2021.12.31	අධ්‍යක්ෂ ජනරාල් - BMICH
මනේෂ් ප්‍රනාන්දු මහතා	2021.01.01 - 2021.12.31	ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය
ගයාංගි වීරසිංහ මෙය	2021.01.01 - 2021.12.31	ශ්‍රී ලංකා අභ්‍යන්තර සංචාරක ක්‍රියාකරුවන්ගේ සංගමය
ෂිබානි ආර්. තම්බයියා මිය	2021.01.01 - 2021.12.31	කොළඹ නගරයේ සංචාරක හෝටල් සංගමය
මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මිය	2021.01.01 - 2021.12.31	ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය
ඉංජි. ශාන්ත සෙනරත්	2021.01.01 - 2021.12.31	වෘත්තීය සංගම් සංවිධානය
ෂර්ලි ජයවර්ධන මිය	2021.01.01 - 2021.12.31	ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය
එම්.ඒ. නන්දනි මිය	2021.01.01 - 2021.12.31	ජාතික අයවැය දෙපාර්තමේන්තුව
ධම්මිකා විජයසිංහ මෙය	2021.01.01 - 2021.12.31	අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
දිමුතු තෙන්නකෝන් මහතා	2021.01.01 - 2021.12.31	ශ්‍රී ලංකන් ගුවන් සේවය
සී.එච්. ගමගේ මහතා	2021.01.01 - 2021.05.09	සංචාරක අමාත්‍යාංශය
එම්.ඩී.එස්. ප්‍රශාදිනි මෙය	2021.05.10 - 2021.12.31	සංචාරක අමාත්‍යාංශය
ආචාර්ය ඩී.එම්. අජිත් දිසානායක මහතා	2021.01.01 - 2021.12.31	ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්

එම්. අනෝමා නන්දනි මිය	AMC හි සභාපතිනිය	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
සුනිල් දිසානායක මහතා	සාමාජික	අධ්‍යක්ෂ ජනරාල් - BMICH
සී.එච්. ගමගේ මහතා	සාමාජික (ජනවාරි 01 - මැයි 05 2021)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන) - සංචාරක අමාත්‍යාංශය
එම්.ඩී.එස්. ප්‍රශාදිනි මෙය	සාමාජික (නොවැ. 01 - දෙසැ. 31 2021)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන) - සංචාරක අමාත්‍යාංශය
මනේෂ් ප්‍රනාන්දු මහතා	සාමාජික (නොවැ. 01 - දෙසැ. 31 2021)	සාමාන්‍යාධිකාරී - හිල්ටන් හෝටලය, කොළඹ
ටී. ඉඹුල්දෙණිය මිය	නිරීක්ෂක	රජයේ විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
පී. ලුරෙන්තරන් මහතා	නිරීක්ෂක	ප්‍රධාන අභ්‍යන්තර විගණක - සංචාරක අමාත්‍යාංශය

සභාපතිතුමියගේ පණිවිඩය

MICE සංචාරක ව්‍යාපාරය (රැස්වීම්, දිරිගැන්වීම් සංචාර, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන / වැඩසටහන්) යනු ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සමඟ එක්ව වර්ධනය වී ඇති විශේෂිත සංචාරක අංශයකි. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ (SLCB) ප්‍රධානතම වගකීම වන්නේ ශ්‍රී ලංකාව MICE සංචාරක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සහ රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සඳහා ගමනාන්තය ලෙස රට ප්‍රවර්ධනය කිරීමයි. කොවිඩ් වසංගතය හේතුවෙන් ගෝලීය වශයෙන් පවතින අහිතකර තත්ත්වයන් නොතකා, විධි නියෝගයට අනුකූලව, SLCB විසින් 2021 වර්ෂය තුළ ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදි.

SLCB විසින් ප්‍රථම අතථ්‍ය MICE Expo, 2021 වර්ෂයේදී පවත්වන ලදී. එය 70කට අධික ප්‍රදර්ශන කුටි සංඛ්‍යාවකින්, ලියාපදිංචි ජාත්‍යන්තර ගැනුම්කරුවන් 487කින්, රැස්වීම් / සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන, මංගල උත්සව සහ දිරිගැන්වීම් සංවිධායකයින් සඳහා ව්‍යාපාරික සංසඳ හතරකින් සමන්විත වූ අතථ්‍ය ප්‍රදර්ශනයක් විය. පශ්චාත් කොවිඩ් MICE කණ්ඩායම් පිළිගැනීම සඳහා ගමනාන්ත සූදානම සහ තරඟකාරිත්වය ප්‍රදර්ශනය කිරීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ විය. ෆෙස්බුක්, ලින්ක්ඩ්ඉන්, ට්විටර්, ඉන්ස්ටග්‍රෑම් සහ යූ ටියුබ් ඉලක්ක කරමින් 'මීට් ඉන් ශ්‍රී ලංකා' යන ටැග්ලයිනය යටතේ SLCB සමාජ මාධ්‍ය වෙත විවිධාංගීකරණය විය. ජාත්‍යන්තර සංචාරකයින් සඳහා ශ්‍රී ලංකාව විවෘත කිරීමට සමගාමීව, කාර්යාංශය විසින් "MICE සංචාරකයින් සහ කණ්ඩායම් පිළිගැනීමට ශ්‍රී ලංකාව සූදානම්" යන පණිවිඩය ලබා දීම සඳහා ප්‍රධාන වෙළඳපළවල වෙබිනාර් කිහිපයක් සංවිධානය කරන ලදි.

රාජ්‍ය තාන්ත්‍රිකයින්, ගුවන් සේවා කාර්ය මණ්ඩලය, ව්‍යාපාරික මණ්ඩල, සංගම්, ගමනාන්ත කළමනාකරණ සමාගම්, රාජ්‍ය නිලධාරීන් සහ ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර සිදුවීම් සංවිධානය කළ හැකි උසස් අධ්‍යාපන ආයතන ඇතුළු පාර්ශ්වකරුවන්ගේ විවිධ අංශ දැනුම්වත් කිරීම සඳහා SLCB විසින් "MICE පිළිබඳ SLCB සභාපතිගේ සංසදය" නමින් සංසද පහක් සංවිධානය කරන ලදී. ප්‍රාදේශීය හෝටල් හිමියන්ගේ ප්‍රයෝජනය සඳහා "MICE UP, ශ්‍රී ලංකාවේ MICE සංචාරක ව්‍යාපාරය නැවත අර්ථ දැක්වීම" යන තේමාව යටතේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි අතථ්‍ය පුහුණු වැඩසටහනක් ද පවත්වන ලදී. කර්මාන්ත අවස්ථා නිර්මාණය කිරීමේ මාර්ගයක් ලෙස "එක්ස්ප්ලෝ 2021" - කළුතර / බේරුවල / බෙන්තොට / මීගමුව ප්‍රදේශවල MICE ස්ථාන පිළිබඳ අතථ්‍ය හුරුපුරුදු කිරීමේ චාරිකාවක් කාර්යාංශය විසින් ප්‍රථම වරට සංවිධානය කරන ලදි.

හුදකලාව කටයුතු කිරීමට වඩා එක්ව වැඩ කිරීම අප විශ්වාස කරන්නෙමු. ඔවුන්ගේ සංචාරක ආකර්ෂණ ස්ථාන ආක්‍රමණශීලී ලෙස අලෙවි කරන අනෙකුත් කලාප සමඟ අප තරඟ කළ යුතු වේ. මේ හේතුවෙන් රාජ්‍ය සාකච්ඡා පැවැත්වෙන ඕනෑම තැනක පෞද්ගලික අංශ සහභාගිත්වය අප විසින් දිරිමත් කරනු ලැබේ. ප්‍රතිපත්ති සම්පාදනය රජයේ වගකීමක් වන අතර පෞද්ගලික අංශය විසින් ව්‍යාපාරය ලාභදායී ලෙස සිදු කරගෙන යා යුතු වේ.

කිමාලි ප්‍රනාන්දු
සභාපතිනි
ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

විධායක සාරාංශය

2021 වර්ෂයේදී කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් ලෝකය යම් සහනයක් අපේක්ෂා කළද, කොවිඩ්-19 නව ප්‍රභේද ඇතිවීම හේතුවෙන් එම අපේක්ෂාවන් කරා ළඟා වීමට නොහැකි වූ අතර එය ලෝකයේ සංචාරක ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් වීම මන්දගාමී වීමට හේතු විය. මෙය 2021 වර්ෂයට නියමිත ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ (SLCB) මුලපිරීම් කිහිපයකට බලපෑමක් ඇති කරන ලදී. කෙසේවෙතත් බොහෝ පුහුණු සහ අලෙවිකරණ කටයුතු සැලසුම් කරන ලද පරිදි සිදු කිරීමට හැකි විය.

සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ දිරිගැන්වීමේ සංචාර හැසිරවීමට සම්බන්ධ විවිධ කාණ්ඩවල පුද්ගලයන්/ සංවිධාන අතර වෘත්තීය කුසලතා වර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ ගුවන් සේවා, ශ්‍රී ලංකාවේ සංගම් සහ වාණිජ මණ්ඩල, MICE කර්මාන්තකරුවන්, අධ්‍යයන ආයතන සහ රාජ්‍ය ආයතන ඉලක්ක කර ගනිමින් MICE දැනුම්වත් කිරීමේ වැඩසටහන් 5ක් SLCB විසින් පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි හෝටල් හිමියන් සඳහා වක් අතථ්‍ය කලාපීය පුහුණු වැඩසටහනක් සහ ශ්‍රී ලංකාවේ MICE කර්මාන්තය සඳහා අතථ්‍ය හුරුපුරුදු කිරීමේ චාරිකාවක්ද පවත්වන ලදී.

ශ්‍රී ලංකාව MICE ගමනාන්තයක් ලෙස අලෙවි කිරීම සඳහා, SLCB විසින් SLCB MICE ප්‍රවර්ධනයන් අතරතුර ලබා දීමක් ලෙස නිෂ්පාදනය කරන ලද SLCB සන්නාමය සහිත රෙදි බෑග් මත නව වෙබ් අඩවියේ URL ප්‍රතිනිෂ්පාදනය කරන ලද අතර මිනිත්තු වකක MICE වීඩියෝ දර්ශන හතරක් නිෂ්පාදනය කරන ලදී. SLCB 'මීට් ඉන් ශ්‍රීලංකා' යන ටැග්ලයිනය යටතේ සමාජ මාධ්‍ය වෙත විවිධාංගීකරණය වූ අතර, ව්‍යාපාරික සිදුවීම් සඳහා ක්ෂුද්‍ර වෙබ් අඩවියක් සංවර්ධනය කිරීම, ඉන්දියානු MICE නියෝජිතයින් සඳහා අතථ්‍ය හුරුපුරුදු චාරිකාවක් සංවිධානය කිරීම, ශ්‍රී ලංකා වෘත්තීය සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ උත්සව සංවිධායකයන්ගේ සංගමය (SLAPCEO) හා එක්ව ශ්‍රී ලංකාවේ පළමු අතථ්‍ය MICE Expo 2021 සංවිධානය කිරීම, "MICE සංචාරකයින් සහ කණ්ඩායම් පිළිගැනීමට ශ්‍රී ලංකාව සූදානම්" යන පණිවිඩය සැපයීම සඳහා සමහර ප්‍රධාන වෙළඳපොළවල වෙබිනා වැඩසටහන් සංවිධානය කිරීම සහ වර්ල්ඩ් රූට්ස් සම්මේලනයට සහභාගි වීම සිදු කරන ලදී. එසේම MICE/ව්‍යාපාරික සිදුවීම් පිළිබඳ MICE සංඛ්‍යාලේඛන එකතු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැතිකම පිළිබඳ ගැටලුව විසඳීම සඳහා SLCB විසින් MICE සංචාරක ව්‍යාපාරය පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කරන ලදී.

2021 වර්ෂයේ ජයග්‍රහණ

1. පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු

1.1 MICE පුහුණුව

1.1.1 SLCB සභාපතිනියගේ සම්මන්ත්‍රණ

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වැඩසටහන් සංවිධානය කළ හැකි විවිධ අංශවල පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම පිණිස ශ්‍රී ලංකා වෘත්තීය සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ උත්සව සංවිධායකයන්ගේ සංගමය (SLAPCEO) සමඟ සහයෝගීතාවයෙන් SLCB "MICE පිළිබඳ SLCB සභාපතිනියගේ සම්මන්ත්‍රණ" නමින් සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී. රට තුළ ජාත්‍යන්තර වැඩසටහන් පැවැත්විය යුතු ආකාරය සහ ඔවුන්ට SLCB වෙතින් ලබා ගත හැකි සහයෝගය පිළිබඳව SLCB විසින් සහභාගිවන්නන් දැනුම්වත් කරන ලදී.

අ) රාජ්‍ය තාන්ත්‍රිකයින් සහ ගුවන් සේවා සඳහා MICE පිළිබඳ SLCB සභාපතිනියගේ 1 වන සම්මන්ත්‍රණය.



මණ්ඩල සාකච්ඡාව සිදු කරමින්

ඉහත සම්මන්ත්‍රණයය 2021 මාර්තු 9 වන දින BMICH හිදී දෙමුහුන් උත්සවයක් ලෙස පවත්වන ලදී. ශ්‍රී ලංකාව MICE ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කරන්නේ කෙසේද, "මීට් ඉන් ශ්‍රී ලංකා" සඳහා සන්නාම දැනුවත් කිරීම සඳහා විදේශයන්හි ගමනාන්ත ප්‍රවර්ධන කටයුතු සංවිධානය කරන්නේ කෙසේද, MICE හා සම්බන්ධ නව තාක්ෂණය ආකර්ෂණය කර ගන්නේ කෙසේද සහ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව සහභාගිවන්නන් දැනුම්වත් කිරීම ප්‍රධාන අරමුණු විය. ශ්‍රී ලංකාවේ විදේශ තානාපතිවරුන් සහ ඔවුන්ගේ ශ්‍රී ලංකාවේ කාර්ය මණ්ඩලය, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල, ගුවන් සමාගම් සහ අනෙකුත් කර්මාන්ත පාර්ශ්වකරුවන් ඇතුළුව භෞතික හා මාර්ගගත සහභාගිවන්නන් 44 දෙනෙක් මෙම සම්මන්ත්‍රණයට සහභාගි විය.

ආ) වාණිජ මණ්ඩල සහ සංගම් සඳහා MICE පිළිබඳ SLCB සභාපතිනියගේ 2 වන සම්මන්ත්‍රණය

තේමාව "ශ්‍රී ලංකාවේ MICE ව්‍යාපාර දියුණු කිරීම සඳහා වාණිජ මණ්ඩල සහ සංගම්වල කාර්යභාරය"

ඉහත සම්මන්ත්‍රණය 2021 අගෝස්තු 18 වන දින සම්පූර්ණ අතථ්‍ය වැඩසටහනක් ලෙස පවත්වන ලදී. ශ්‍රී ලංකාව MICE ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කරන්නේ කෙසේද, කලාපීය සහ ජාත්‍යන්තර MICE වැඩසටහන් සඳහා ලංසු තැබීම සඳහා සබඳතා ගොඩනගා ගන්නේ කෙසේද, ශ්‍රී ලංකාවට වැඩසටහන් ආකර්ෂණය කර ගැනීම සඳහා කලාපීය සහ ජාත්‍යන්තර ව්‍යාපාරික මණ්ඩල සහ සංගම් ජාල වෙත ළඟා

වීමට සහාය ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳව සහභාගිවන්නන් දැනුම්වත් කිරීම ප්‍රධාන අරමුණු විය. ව්‍යාපාරික මණ්ඩල සහ සංගම් නියෝජනය කරමින් අතථ්‍ය සහභාගිවන්නන් 80ක් මෙම සම්මන්ත්‍රණයට සහභාගි විය.

ඇ) ගමනාන්ත කළමනාකරණ සමාගම් සඳහා MICE පිළිබඳ SLCB සභාපතිනියගේ 3 වැනි සම්මන්ත්‍රණය

තේමාව "පශ්චාත් කොවිඩ්-19 යුගයේ ශ්‍රී ලංකාවේ MICE ස්ථානගත කිරීම"

ඉහත සම්මන්ත්‍රණය නොවැම්බර් 23 වැනි දින BMICH හිදී දෙමුහුන් සම්මන්ත්‍රණයක් ලෙස සංවිධානය කරන ලදී. වර්තමාන MICE ප්‍රවණතා පිළිබඳව සහභාගිවන්නන් දැනුම්වත් කිරීම, MICE සඳහා ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ අවබෝධයක් ලබා දීම, නිර්මාණශීලිත්වය වැඩිදියුණු කිරීම සහ MICEy බවට පත්වීමට ඔවුන්ව පොළඹවා ගැනීම, MICE හා සම්බන්ධ දැනුම වැඩි දියුණු කිරීම සඳහා පුහුණු හා සංවර්ධන සහායන් සහ මුලපිරීම් හඳුනා ගැනීම සහ කලාපීය සහ ජාත්‍යන්තර MICE වැඩසටහන් සඳහා ලංසු තැබීමට ඇති අලෙවිකරණ සහාය හඳුනා ගැනීම මෙහි ප්‍රධාන අරමුණු විය.

වෘත්තීය සම්මන්ත්‍රණ/ප්‍රදර්ශන සංවිධායකයන්, ගමනාන්ත/වැඩසටහන් කළමනාකරණ සමාගම්, රැස්වීම් සැලසුම්කරුවන්, දිරිගැන්වීමේ සංචාර සංවිධායකයන්, සම්මේලන හෝටල්, MICE ස්ථාන සහ නරඹන්නන්ගේ අත්දැකීම් සේවා සපයන්නන් නියෝජනය කරමින් මාර්ගගත සහභාගිවන්නන් 170ක් මෙම සම්මන්ත්‍රණයට සහභාගි වීම සඳහා ලියාපදිංචි විය.

ඈ) රාජ්‍ය ආයතන සඳහා MICE පිළිබඳ SLCB සභාපතිනියගේ 4 වැනි සම්මන්ත්‍රණය

තේමාව "ශ්‍රී ලංකාවේ MICE සංවර්ධනය සඳහා රාජ්‍ය යාන්ත්‍රණය"

MICE පිළිබඳ SLCB සභාපතිනියගේ 4 වන සම්මන්ත්‍රණය නොවැම්බර් 29 වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී දිවා භෝජන සම්මන්ත්‍රණයක් ලෙස සංවිධානය කරන ලදී. MICE මඟින් සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලබා දෙන ආකාරය පිළිබඳව සහභාගිවූවන් දැනුම්වත් කිරීම සහ MICE වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාව වඩාත් කැමති තේරීමක් බවට පත් කිරීම සඳහා ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සත්කාරකයන් බවට පත් වීමෙන් ඔවුන්ගේ ආයතනවලට ඇති අවස්ථාවන් භාවිතා කරමින් ඔවුන්ගේ ක්ෂේත්‍රවල ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමට ඔවුන් පෙළඹවීම ප්‍රධාන අරමුණු විය. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය මණ්ඩල, රාජ්‍ය සංස්ථා, අර්ධ රාජ්‍ය සංවිධාන, පළාත් සභා, මහනගර සභා සහ අනෙකුත් පළාත් පාලන ආයතනවල රාජ්‍ය නිලධාරීන් නියෝජනය කරමින් මෙම අවස්ථාවට සහභාගි වීමට මුළු නියෝජිතයින් 36 දෙනෙක් ලියාපදිංචි විය.



සම්මන්ත්‍රණය පැවැත්වෙමින්

ඉ) උසස් අධ්‍යාපන ආයතන සඳහා MICE පිළිබඳ SLCB සභාපතිනියගේ 5 වැනි සම්මන්ත්‍රණය

තේමාව "උසස් අධ්‍යාපන ආයතන හරහා MICE ආර්ථික සංවර්ධනය"

ඉහත සම්මන්ත්‍රණය නොවැම්බර් 29 වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී භෞතික සම්මන්ත්‍රණයක් ලෙස සංවිධානය කරන ලදී. MICE මඟින් සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලබා දෙන ආකාරය පිළිබඳව සහභාගිවූවන් දැනුම්වත් කිරීම සහ MICE වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාව වඩාත් කැමති තේරීමක් බවට පත් කිරීම සඳහා ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සත්කාරකයන් බවට පත් වීමෙන් ඔවුන්ගේ ආයතනවලට ඇති අවස්ථාවන් භාවිතා කරමින් ඔවුන්ගේ ක්ෂේත්‍රවල ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමට ඔවුන් පෙළඹවීම සහ MICE ශ්‍රම බලකාය සංවර්ධනය කිරීම ප්‍රධාන අරමුණ විය. මෙම වැඩසටහනට සහභාගි වීමට දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල/පාසල් නියෝජනය කරමින් 44 දෙනෙකු ලියාපදිංචි විය.



ප්‍රශ්නෝත්තර සැසිය සිදු කරමින්

1.1.2 හෝටල් හිමියන්, ස්ථාන සපයන්නන් සහ අමුත්තන්ගේ අත්දැකීම් සපයන්නන් සඳහා කලාපීය MICE පුහුණු වැඩසටහන

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය හෝටල් හිමියන්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය සම්මන්ත්‍රණ ප්‍රදර්ශන සහ උත්සව සංවිධායකයින්ගේ සංගමයේ සහයෝගිතාවයෙන් "MICE UP, ශ්‍රී ලංකාවේ එෂෂ සංචාරක කර්මාන්තය නැවත අර්ථ දැක්වීම" යන තේමාව යටතේ අතථ්‍ය පුහුණු වැඩසටහනක් 2021 ඔක්තෝබර් 18 වන දින පවත්වන ලදී.

මෙම වැඩසටහන මඟින් කොවිඩ්-19 වසංගතයෙන් පසු වැඩසටහන් හැසිරවීමට අදාළ වැදගත් අංග ඉස්මතු කරන ලදී. සංචාර සහ වැඩසටහන් සංවිධානය කිරීමේ අංශ මුහුණ දී ඇති ගැටලු පිළිබඳව සහ සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව සාර්ථක වැඩසටහනක් ඵලදායී ලෙස සංවිධානය කරන්නේ කෙසේද යන්න පිළිබඳව මෙම පුහුණුවේදී අවධානය යොමු කරන ලදී.

මෙම මාර්ගගත සැසියට දිවයින පුරා සිටින 100 කට අධික පිරිසක් සහභාගි වූ අතර ඔවුන් ධනාත්මක ආකල්පයකින් MICE මෙහෙයුම් නැවත ආරම්භ කිරීමට මහත් උද්යෝගයක් දැක්විය.

1.1.3 "එක්ස්ප්ලෝ 2021" - කළුතර/ බේරුවල/ බෙන්තොට/ මීගමුව ප්‍රදේශවල MICE ස්ථාන පිළිබඳ අතථ්‍ය හුරුපුරුදු කිරීමේ චාරිකාව

"2021 ගවේෂණය කරන්න" යන තේමාව යටතේ කොළඹ සිට බේරුවල දක්වා සහ කොළඹ සිට වයික්කාල දක්වා ප්‍රදේශවල පිහිටි නවතම සහ අද්විතීය MICE ස්ථාන වෙත SLCB සිය ප්‍රථම අතථ්‍ය හුරුපුරුදු කිරීමේ චාරිකාව සංවිධානය කළේය. දේශීය වෘත්තීය සම්මන්ත්‍රණ සංවිධායකයින්, ප්‍රදර්ශන සංවිධායකයින්, වැඩසටහන් සංවිධායකයින්, රැස්වීම් සැලසුම්කරුවන්, මංගල සැලසුම්කරුවන් සහ ගමනාන්ත කළමනාකරණ සමාගම් නියෝජනය කරමින් 100 කට අධික පිරිසක් සංචාරයට සහභාගි වීමට ලියාපදිංචි වූ අතර MICE ක්‍රියාකාරකම් සඳහා පවතින නවතම සහ අද්විතීය ස්ථාන වෙත යාවත්කාලීන විය. සිත් ඇදගන්නාසුළු ස්ථානවල විවිධ රැස්වීම් අත්දැකීම් අපේක්ෂාවෙන් සිටින විදේශීය රැස්වීම් සැලසුම්කරුවන්ට මෙම දේපල අලෙවිකරණය කිරීම සඳහා සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට ප්‍රේක්ෂකයින්ට හැකි විය.

1.2 කර්මාන්ත සාමාජිකයන් අතර දැනුම බෙදාගැනීම

දැනුම හුවමාරු කර ගැනීමේ මාර්ගයක් ලෙස, නව සාමාන්‍ය තත්ත්වය තුළ විදේශ ගැනුම්කරුවන් අතර ශ්‍රී ලංකාව අලෙවිකරණය කිරීමේදී සහ ප්‍රවර්ධනය කිරීමේදී තරඟකාරී වීම සඳහා දේශීය MICE කර්මාන්තයේ සාමාජිකයින් සමඟ SLCB පහත ප්‍රවණතා වාර්තා බෙදා ගත්තේය.

අ) IBTM ට්‍රෙන්ඩ්ස් වොච් වාර්තාව 2021 : මෙම වාර්තාව 2020 වර්ෂයේ මාස 12 තුළ සිදු වූ වඩාත් නාට්‍යමය භූ දේශපාලනික සිදුවීම් කිහිපයක් සහ ඉදිරි කාල සීමාවේදී සිදු වේ යැයි පුරෝකථනය කරන සිදුවීම් ආවරණය කරයි.

ආ) ICCA කාඔෂියන්ග් ප්‍රොටෝකෝලය - මෙය ගෝලීය MICE/වැඩසටහන් කර්මාන්තය සඳහා ICCA (ජාත්‍යන්තර සංගම් සහ සම්මන්ත්‍රණ සංගමය) විසින් සම්පාදනය කරන ලද උපාය මාර්ගික ප්‍රතිසාධන රාමුවකි. ICCA ට අනුව, මෙම උපාය මාර්ගයේ අරමුණ වන්නේ : MICE කර්මාන්තයට සහ එහි සාමාජිකයින්ට බලපාන ප්‍රධාන සාර්ව සහ ක්ෂුද්‍ර ප්‍රවණතා; MICE අංශය විසින් ක්‍රියාත්මක කිරීම සලකා බැලිය යුතු වැදගත් උපාය මාර්ග; සහ අනාගත නව සාර්ථක වැඩසටහන් ප්‍රමිතික හඳුනාගැනීමයි.

ඇ) ඉහළම ගෝලීය පාරිභෝගික ප්‍රවණතා 10 - 2021 : මෙම වාර්තාවේ "යුරෝමොනිටර් ඉන්ටර්නැෂනල්" විසින් හඳුනාගෙන ඇති නැගී එන සහ වේගයෙන් චලනය වන ඉදිරි වර්ෂයේදී සාර්ථක වීමක් අපේක්ෂා කරන ප්‍රවණතා ඇතුලත් වේ. මෙම ප්‍රවණතා මඟින් පාරිභෝගික වටිනාකම් වෙනස් වීම, පාරිභෝගික හැසිරීම් වෙනස් වන්නේ කෙසේද යන්න ගවේෂණය කිරීම සහ ගෝලීය වශයෙන් ව්‍යාපාරවලට බාධා ඇති කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දී ඇත.

ඈ) 2020 GBTA BTI™ ඉදිරි දැක්ම - වාර්ෂික ගෝලීය වාර්තාව සහ පුරෝකථනය 2020-2024

1.3 MICE සංඛ්‍යා ලේඛන

2020 වර්ෂයේදී, කළමනාකරණ මණ්ඩලය විසින් ලබා දුන් නියෝගයකට අනුව, සංචාරක සංවර්ධන බද්ද ගෙවන අවස්ථාවේ කර්මාන්තයෙන් MICE දත්ත රැස් කිරීම සඳහා සංචාරක සංවර්ධන බදු ගෙවීම් ආකෘතිවලට ඇමුණුමක් ඇතුළත් කරන ලෙස SLCB, SLTDA වෙත ඉල්ලීමක් කළේය

කෙසේවෙතත්, MICE කර්මාන්ත සාමාජිකයින් MICE දත්ත සපයා නොමැති බව SLCB විසින් 2021 තුන්වන කාර්තුව අවසානයේ සොයා ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කර්මාන්ත හා සෘජුවම සම්බන්ධ වී MICE දත්ත ලබා ගැනීමේ පෙර ක්‍රමවේදය වෙත ආපසු යාමට SLCB හට සිදු විය. කර්මාන්තයෙන් ලබාගත් දත්තවල සාරාංශයක් පහත දැක්වේ

පහත ප්‍රස්ථාරයෙන් දැක්වෙන්නේ වාර්තා කර ඇති මුළු MICE වැඩසටහන් 404න් එක් එක් කාණ්ඩය තුළ පවත්වන ලද MICE වැඩසටහන් ප්‍රතිශතයයි.



සමහර වැඩසටහන් සංවිධායකයින් කොවිඩ්-19 හි උච්චාවචනය වන තර්ජනය මත පදනම්ව විකල්ප පැවති සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව ඔවුන්ගේ සැලසුම්ගත ඵෂඤ වැඩසටහන් අනුවර්තනය කර ඔවුන්ගේ වැඩසටහන් දෙමුහුන් සහ අතථ්‍ය වැඩසටහන් බවට පරිවර්තනය කළේය. පහත ප්‍රස්ථාරයෙන් භෞතික වැඩසටහන් සහ අතථ්‍ය වැඩසටහන් ප්‍රතිශතය ලබා දේ.



1.4 SLCB MICE ගැනුම්කරුවන්ගේ දත්ත සමුදාය

විදේශීය MICE ගැනුම්කරුවන්ගේ තොරතුරු අඩංගු SLCB MICE ගැනුම්කරුවන්ගේ දත්ත සමුදාය වසර පුරා මාර්ගගතව සත්කාරකත්වය සපයන ලදී. දේශීය MICE කර්මාන්තකරුවන් ඔවුන්ගේ ඉලක්කගත අලෙවිකරණ ක්‍රියාකාරකම් සඳහා මෙම ගැනුම්කරුවන්ගේ තොරතුරු භාවිතා කරනු ලබන බවට අපේක්ෂා කෙරේ.

2. අලෙවිකරණය

SLCB අලෙවිකරණ අංශයේ මූලික වගකීම වන්නේ MICE සංචාරක ව්‍යාපාරය අලෙවිකරණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සඳහා ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ පැතිකඩ ප්‍රවර්ධනය කිරීමයි.

කොවිඩ්-19 ව්‍යාප්තිය නොතකා පහත අලෙවිකරණ වැඩසටහන් සිදු කරන ලදී.

2.1 MICE වීඩියෝ නිෂ්පාදනය කිරීම

මිනිත්තු එක බැගින් වූ MICE වීඩියෝ පට හතරක් නිෂ්පාදනය කරන ලදී. එම වීඩියෝ මඟින් MICE අංශවල තේමා හතරක් ආවරණය කරන ලදී. පළමු වීඩියෝව "කොළඹ MICE සංචාරකයෙකුගේ දිනය" යන තේමාව යටතේ නිෂ්පාදනය කරන ලද අතර ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ MICE පහසුකම් ප්‍රදර්ශනය කිරීම සඳහා දෙවන වීඩියෝව නිෂ්පාදනය කරන ලදී. තෙවන සහ සිව්වන වීඩියෝ මඟින් උතුරු කලාපයේ MICE ස්ථාන, ආකර්ෂණීය ස්ථාන සහ වැඩසටහන් ආවරණය කරන ලදී.

මීට අමතරව, වසර තුළ අධ්‍යාපනික වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා තත්පර 30 ක වීඩියෝ 10 ක් නිෂ්පාදනය කරන ලදී.

2.2 ප්‍රවර්ධන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ මුද්‍රණය කිරීම

SLCB වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියේදී, SLCB වෙබ් URL www.visitsrilanka.net සිට www.meetinsrilanka.com ලෙස වෙනස් කරන ලදී. SLCB MICE ප්‍රවර්ධන වැඩසටහන්වලදී ලබා දීම සඳහා නිෂ්පාදනය කරන ලද SLCB සන්නාමය සහිත රෙදි බෑග්වල නව වෙබ් URL නැවත මුද්‍රණය කරන ලදී.

2.3 වෙබ් පාදක ප්‍රවර්ධන/ඩිජිටල් ප්‍රවර්ධන/SEO කාර්යය

අ) SLCB වෙබ් අඩවිය - SLCB වෙබ් අඩවිය www.meetinsrilanka.com ශ්‍රී ලංකා ටෙලිකොම් සමඟ සහයෝගයෙන් පවත්වාගෙන ගිය අතර වෙබ් අඩවියට නව විශේෂාංග එක් කරන ලදී. උදා: කොවිඩ්- 19 යාවත්කාලීන කිරීම්, බ්ලොග් පිටුව, ග්‍රාහක ආකෘති පත්‍රය.

ආ) සමාජ මාධ්‍ය ව්‍යාපාරය - SLCB 'මීට් ඉන් ශ්‍රී ලංකා' යන ටැග්ලයිනය යටතේ සමාජ මාධ්‍ය වෙත විවිධාංගීකරණය විය. මෙම ව්‍යාපාරය 2021 මාර්තු මාසයේදී ආරම්භ විය. SLCB විසින් ප්‍රථම වරට සමාජ මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර ෆෙස්බුක්, ලින්ක්ඩ්ඉන්, ට්විටර්, ඉන්ස්ටග්‍රෑම් සහ යූටියුබ් වෙත අවධානය යොමු කරන ලදී.

ලොව පුරා පවතින සංචාරක සීමා කිරීම් සහ නිරෝධායන ක්‍රියාවලිය හේතුවෙන්, සංසන්දනාත්මක අඩු වියදමකින්, බලපෑමක් සහිත සහ ඵලදායී ආකාරයෙන් ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත ළඟා වීමට SLCB සමාජ මාධ්‍ය වෙත අවධානය යොමු කළේය. සමාජ මාධ්‍ය හරහා ස්ථානගත වීම තුළින්, ඉලක්ක වෙළඳපොළවල් වෙත අද්විතීය අගය යෝජනා (USPs) බෙදා හැරීමට SLCB සමත් විය.

අතීතයේ දී ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය වෙළඳ ප්‍රදර්ශන, දේශ ප්‍රවර්ධන සහ හුරුපුරුදු කිරීමේ චාරිකා කෙරෙහි අවධානය යොමු කළේය. වසංගතය සමඟ, SLCB ඩිජිටල් ප්‍රවර්ධන ව්‍යාපාරයට මාරු විය. SLCB හි අභිප්‍රාය වූයේ MICE සහ ශ්‍රී ලංකාව සජීවීව තබා ගැනීමයි. මෙම ව්‍යාපාරය මඟින් MICE සහ විවේකය සඳහා ගමනාන්තයක් ලෙස ජාත්‍යන්තරව ගමනාන්තයේ තරඟකාරිත්වය සහ ආකර්ශණීය බව ප්‍රවර්ධනය කළේය.

මෙම ප්‍රචාරණ ව්‍යාපාරය හරහා, ගමනාන්ත සංයුක්තතාවය, අව්‍යාජත්වය සහ විවිධත්වය සන්නිවේදනය කරමින් "මීට් ඉන් ශ්‍රී ලංකා" යන ටැග්ලයිනය නැවත ස්ථානගත කිරීමට SLCB අපේක්ෂා කරයි.

මාර්තු 15 සිට දෙසැම්බර් 14 දක්වා මාස 09 ක කාලය තුළ කාර්ය සාධනය පහත පරිදි වේ.



ඇ) MICE සහ ව්‍යාපාර වැඩසටහන් සඳහා ක්ෂුද්‍ර වෙබ් අඩවිය - වර්ෂය තුළ, SLCB විසින් ව්‍යාපාරික වැඩසටහන් සඳහා ක්ෂුද්‍ර වෙබ් අඩවියක් සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. www.srilanka.travel/helloagain ට සමාන www.srilanka.travel වෙත "ව්‍යාපාරික වැඩසටහන්" ඇතුළත් කිරීම සඳහා මෙම වෙබ් අඩවිය සංවර්ධනය කරන ලදී. පිරිසැලසුම සහ මූලික අන්තර්ගතය මුලපිරීමට අනුකූලව සංවර්ධනය කරන ලදී

ඈ) SLCB MICE පාර්ශ්වකරුවන්ගේ "ඊමේල් අලෙවිකරණ" ව්‍යාපාරය

අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු සඳහා වසරක කාලයක් සඳහා www.sendpulse.com වෙතින් තොග විද්‍යුත් තැපැල් පහසුකමක් SLCB විසින් මිලදී ගන්නා ලදී. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට අන්තර්ජාලය හරහා ඇමෙරිකානු ඩොලර් ගෙවීමෙන් සෘජුවම පහසුකම මිලදී ගැනීමට නොහැකි වූ බැවින් SLCB විසින් පත් කරන ලද ඩිජිටල් අලෙවිකරණ සමාගම හරහා එම පහසුකම ලබා ගන්නා ලදී. අතථ්‍ය MICE Expo 2021 ප්‍රවර්ධනය කිරීම සඳහා SLCB ඉහත පහසුකම භාවිතා කළේය.

2.4 අලෙවි ප්‍රවර්ධන - දේශීය සහ ජාත්‍යන්තර

SLCB වර්ෂය තුළ ඉන්දියාවේ ට්‍රැවල් නිවුස් ඩයිජස්ට් (TND) හි ප්‍රචාරණය කරන ලදී. TND හි දැන්වීම් පහක් පළ විය. MICE එක්ස්පෝ 2021 ට සමගාමීව, SLCB විසින් 2021 දෙසැම්බර් මාසයේදී Daily FT හි සම්පූර්ණ පිටුවක පුවත් පත් අතිරේකයක් ප්‍රකාශයට පත් කරන ලදී. වර්ෂය තුළ, SLCB විසින් TTG MENA කලාපය පිළිබඳ ශ්‍රී ලංකා දේශ වාර්තාව සඳහා MICE යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කරන ලදී. කොවිඩ්-19 තත්ත්වය හේතුවෙන් අනෙකුත් ජාත්‍යන්තර සඟරාවල ප්‍රචාරණය වර්ෂය තුළ සිදු නොකළ අතර 2022 වර්ෂය සඳහා සලකා බලනු ඇත.

2.5 විදේශ ප්‍රදර්ශන/ප්‍රවර්ධන සහ වැඩසටහන්වල සහභාගිත්වය

වසංගතය හේතුවෙන්, SLCB විසින් ජාත්‍යන්තර MICE ප්‍රදර්ශන හෝ දේශ විශේෂිත MICE ප්‍රවර්ධන කිසිවක් සංවිධානය නොකළේය. වසංගතය හේතුවෙන් ජාත්‍යන්තර ප්‍රදර්ශන කල් දැමීම හෝ අවලංගු කිරීම සිදු කරන ලදී. අතථ්‍ය වේදිකාවල වැඩසටහන් කිහිපයක් සිදු කරන ලදී. 2021 අප්‍රේල් 07 සිට 09 දක්වා ඉන්දියාවේ ITB හි පැවති අතථ්‍ය සම්මන්ත්‍රණයට SLCB සහභාගි විය. මෙම අවස්ථාවට සමගාමීව පැවති "කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීම සහ 2021 සඳහා සැලසුම්" යන සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකා සංචාරක සභාපතිනිය සහභාගි විය.

2.6 MICE හුරුපුරුදු කිරීමේ සංචාර

SLCB විසින් 2021 ඔක්තෝබර් මාසයේදී ඉන්දියානු MICE නියෝජිතයින් සඳහා අතථ්‍ය හුරුපුරුදු කිරීමේ චාරිකාවක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන SLCB විසින් සංවිධානය කරන ලද පළමු අතථ්‍ය හුරුපුරුදු කිරීමේ චාරිකාව විය. මෙම වැඩසටහන මඟින් කොළඹ MICE පහසුකම් සහ ආකර්ෂණීය ස්ථාන ප්‍රදර්ශනය කරන ලදී





MICE සංචාරක බලපෑම් පහසුකම් සැපයීමේ වැඩසටහනට සමගාමීව, ශ්‍රී ලංකාව තුළ පවතින MICE අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා SLCB විසින් ඉන්දියා අවුට්බවුන්ඩ් හි (IO) මාධ්‍ය නියෝජිතයින්ගේ සංචාරයක් සංවිධානය කරන ලදී. ඉන්දියා අවුට්බවුන්ඩ් යනු ඉන්දියාවේ විදේශ ගමනාන්තයන් ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම කැප වූ මුද්‍රිත සඟරාවක්, වෙබ් අඩවියක්, මාර්ගගත රූපවාහිනී නාලිකාවක් සහ ගතික සමාජ මාධ්‍ය වේදිකා ඇතුළත් වන ඉන්දියාවේ එකම B2B සංචාරක මාධ්‍ය වේදිකාව වේ. ශ්‍රී ලංකා අථත්‍ය MICE එක්ස්පෝ 2021 ට සමගාමීව මෙම සංචාරය සංවිධානය කරන ලදී.

වර්ෂය තුළදී, ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් ඉන්දියානු සංචාර මෙහෙයවන්නන් සහ මාධ්‍ය සඳහා සංවිධානය කරන ලද හුරුපුරුදු කිරීමේ චාරිකාව සඳහා SLCB සම්බන්ධ විය. හුරුපුරුදු කිරීමේ සංචාරයේ කොටසක පිරිවැය SLCB මඟින් ආවරණය කරන ලදී.

සංචරණ සීමා කිරීම් හේතුවෙන් භෞතික හුරුපුරුදු කිරීමේ චාරිකා සංවිධානය නොකෙරිණි.

2.7 ශ්‍රී ලංකා අථත්‍ය MICE එක්ස්පෝ 2021

ශ්‍රී ලංකා වෘත්තීය සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ උත්සව සංවිධායකයින්ගේ සංගමය (SLAPCEO) සමඟ සහයෝගිත්වයෙන් SLCB විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ සමාරම්භක අතථ්‍ය MICE එක්ස්පෝ 2021 ප්‍රදර්ශනය 2021 දෙසැම්බර් 1 සිට 3 දක්වා පැවැත්විණි. ප්‍රදර්ශන කුටි 70 කට අධික සංඛ්‍යාවකින් සමන්විත වූ අතථ්‍ය ප්‍රදර්ශනයකින්, ලියාපදිංචි ජාත්‍යන්තර ගැනුම්කරුවන් 487කින් සහ රැස්වීම්/සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන, මංගල සහ දිරිගැන්වීම් සංවිධායකයින් සඳහා ව්‍යාපාරික සංසඳ හතරකින් ප්‍රදර්ශනය සමන්විත විය. 2021 එක්ස්පෝ ට සමගාමීව මීට් ඉන් ශ්‍රී ලංකා වීඩියෝ එකතුව, හරිත වැඩසටහන් මුලපිරීම් දියත් කිරීම, අතථ්‍ය තේ අත්දැකීම, ශ්‍රී ලංකා සූපශාස්ත්‍ර අත්දැකීම්, අතථ්‍ය සුවතා අත්දැකීම සහ මාස්ටර් MICE අභියෝග ප්‍රශ්නාවලි තරඟාවලිය සංවිධානය කරන ලදී. BMICH එහි ප්‍රධාන අනුග්‍රාහකයා වූ අතර වෝටර්ස් එජ් සම අනුග්‍රාහකයා ලෙස සම්බන්ධ විය. පශ්චාත් කොවිඩ් MICE කණ්ඩායම් පිළිග ැනීම සඳහා ගමනාන්ත සූදානම සහ තරඟකාරිත්වය ප්‍රදර්ශනය කිරීම මෙම උත්සවය සංවිධානය කිරීමෙහි ප්‍රධාන අරමුණ විය.





2.8 වෙබිනා වැඩසටහන්

ජාත්‍යන්තර සංචාරකයින් සඳහා ශ්‍රී ලංකාව විවෘත කිරීමට සමගාමීව, "MICE සංචාරකයින් සහ කණ්ඩායම් පිළිගැනීමට ශ්‍රී ලංකාව සූදානම්" යන පණිවිඩය සැපයීම සඳහා SLCB සමහර ප්‍රධාන වෙළඳපොළවල වෙබිනා සංවිධානය කළේය. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ MICE සංචාරක ව්‍යාපාරය ආරම්භ කිරීමේ අරමුණට අනුකූලව SCLB මුම්බායි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය සමඟ එක්ව '2022 MICE සූදානම් කිරීමට සූදානම් වීම' පිළිබඳ වෙබිනා වැඩසටහනක් සංවිධානය කළේය. වෙබිනා වැඩසටහන 2021 ඔක්තෝබර් 06 දින සංවිධානය කරන ලදී.

SLCB නව දිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ ඉන්දු-ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (ISCCI) සමඟ එක්ව 'ශ්‍රී ලංකාව නිවාඩු සහ ව්‍යාපාරික ගමනාන්තයක් ලෙස බැබලවීම' නමින් වෙබිනා වැඩසටහනක් සංවිධානය කළේය. එය ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සහ ශ්‍රී ලංකාව තුළ පවතින ව්‍යාපාරික අවස්ථා පිළිබඳව අවධානය යොමු කරන ලද අතර 2021 ඔක්තෝබර් 27 වැනි දින පවත්වන ලදී.

SLCB බංග්ලාදේශයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමඟ සහයෝගිත්වයෙන් 2021 නොවැම්බර් මාසයේදී MICE සංචාරක ව්‍යාපාරය පිළිබඳ අන්තර් ක්‍රියාකාරී වෙබිනා වැඩසටහනක් සංවිධානය කරන ලදී.

2.9 SLCB MICE සංචාරක සහාය යෝජනා ක්‍රමය සහ වැඩසටහන් සහාය

සියලුම භෞතික, දෙමුහුන් සහ අතථ්‍ය වැඩසටහන් ආවරණය කිරීම පිණිස කර්මාන්ත සහාය සඳහා SLCB MICE සංචාරක සහාය යෝජනා ක්‍රමය පවතී. යෝජනා ක්‍රමය පිළිබඳ විද්‍යුත් පත්‍රිකාව SLCB වෙබ් අඩවියට උඩුගත කරන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2021 සඳහා සැලසුම් කරන ලද බොහෝ වැඩසටහන් අවලංගු කිරීමට සිදු විය. වර්ෂය තුළදී, SLCB අතථ්‍ය සහ දෙමුහුන් ලෙස සංවිධානය කරන ලද වැඩසටහන් නවයක් සඳහා සහාය විය.

2.10 වර්ල්ඩ් රූට්ස් සම්මේලනය 2021

SLCB විසින් 2021 ඔක්තෝබර් 18 සිට 20 දක්වා පැවති වර්ල්ඩ් රූට්ස් සම්මේලනයේ ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමඟ සහයෝගිත්වයෙන් සම්මේලනය සංවිධානය කරන ලද අතර ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයෙහි සභාපතිනිය, ශ්‍රී ලංකන් එයාර්ලයින් හි සභාපතිවරයා අථත්‍ය වැඩසටහන අමතන ලදී. ගුවන් මාර්ග සංවර්ධනය, සංචාරක ව්‍යාපාරය සහ MICE අවස්ථා ප්‍රවර්ධනය කිරීම ඉහත උත්සවය සංවිධානය කිරීමේ ප්‍රධාන අරමුණ විය.

වර්ල්ඩ් රූට්ස් යනු B2B වේදිකාවක් වූ අතර එය ගමනාන්ත වෙත නව ගුවන් සේවා සැපයීම සඳහා ගුවන් සේවා පාර්ශ්වකරුවන් සහ සංචාරක සංවිධාන සඳහා අවස්ථාව උදා කරන ලදී. නව ගුවන් සේවා සංවර්ධනය ගමනාන්තයකට සංචාරක ගමනාගමනය වැඩි කිරීමට නව ආරම්භයක් විය. ගුවන් සේවා සහ සංචාරක කර්මාන්තයේ ප්‍රමුඛයන් වන කථිකයන් සම්බන්ධ වන විවිධ වැඩසටහන් සහ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සමුළු හරහා ඉදිරි සංවර්ධන මෙන්ම ජාලකරණ අවස්ථා සාකච්ඡා කිරීමට රූට්ස් සියලු ගුවන් සේවා සහ සංචාරක පාර්ශ්වකරුවන් එකම වේදිකාවකට ගෙන එන ලදී.

2.11 MICE සංචාරක කර්මාන්තය පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව

MICE/ව්‍යාපාර වැඩසටහන් පිළිබඳ MICE සංඛ්‍යාලේඛන එකතු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැතිකම පිළිබඳ ගැටලුව විසඳීම සඳහා SLCB විසින් MICE සංචාරක ව්‍යාපාරය පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කරන ලදී. MICE සංචාරක ව්‍යාපාරය සඳහා නව වීසා කාණ්ඩයක් නිර්මාණය කිරීමටත්, සංචාරක වීසාවලට සමාන ගාස්තුවක් අය කිරීමටත්, ආගමනයේදී පැමිණීමේ කාඩ්පතෙහි MICE කුළුණු (රැස්වීම්, සම්මන්ත්‍රණ, දිරිගැන්වීම් සහ ප්‍රදර්ශන සහ වැඩසටහන්) ඇතුලත් කිරීමටත්, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (BIA) MICE මගීන් සඳහා වෙනම කවුන්ටරයක් ඇති කිරීමටත් SLCB යෝජනා කළේය. සංචාරක අමාත්‍යාංශය විසින් වර්ෂය තුළදී අමාත්‍ය මණ්ඩල සංදේශය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඔවුන්ගේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇත.

3. මානව සම්පත් සහ පරිපාලනය

3.1 SLCB කාර්ය මණ්ඩලය

කිමාලි ප්‍රනාන්දු මිය	- සභාපති
ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා	- සමානයාධිකාරී
අචිනි දන්දුන්නගේ මිය	- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි
කුමුදු හැන්නදිගේ මිය	- කළමනාකාරිනි, පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු
මල්කාන්ති වැලිකල මිය	- කළමනාකාරිනි, අළෙවි සහ ප්‍රවර්ධන
පියුමි පීරිස් මෙය	- සහකාර කළමනාකාරිනි පර්යේෂණ, සංවර්ධන, වාණිජ ප්‍රමිත, සාංගමික රැස්වීම්
රන්ජිකා පෙරේරා මිය	- සහකාර කළමනාකාරිනි, ගිණුම් සහ පරිපාලන
හේමාලි මහමුදලි මිය	- සහකාර කළමනාකාරිනි, අභ්‍යන්තර විගණන
ජනිත් භාතිය මයා	- සහකාර කළමනාකරු, ආයතනික, දිරිගැන්වීම් සහ වැඩසටහන්
ලක්ෂිකා බණ්ඩාර මිය	- කණිෂ්ඨ කළමනාකාරිනි, මානව සම්පත් සහ මණ්ඩල කටයුතු
දිනුෂ්කා ෆොන්සේකා මිය	- කළමනාකරණ සහකාර, සමානයාධිකාරිවරයාගේ ලේකම්
ඩිල්ශානි දාබරේ මෙය	- කළමනාකරණ සහකාර, ගිණුම් සහ පරිපාලන
සමෘද්ධි වාස් මිය	- කළමනාකරණ සහකාර, ප්‍රසම්පාදන
ප්‍රබෝධ විජේසූරිය මයා	- කාර්යාල සහායක
පී.ජී. සුපුන් කෞශල්‍ය මයා	- රියදුරු

4. අභ්‍යන්තර විගණන

ආයතනයේ මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රමිතීන් රජයේ ප්‍රමිති සහ රෙගුලාසිවලට අනුකූල බව අභ්‍යන්තර විගණන අංශය තහවුරු කරයි. 2021 වර්ෂය සඳහා නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන වාර්තා නවයෙහි තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අදහස් සහ නිර්දේශ ඇතුළත් වේ. උත්සාහයන්වල ප්‍රතිඵලයක් වශයෙන්, අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවැය ඉතිරිකිරීම් සහ ක්‍රියාවලි විධිමත් කිරීම සිදු වී ඇත. අභ්‍යන්තර විගණනය කාර්තුමය විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් ද පවත්වා ඇත.

5. එකතු කළ ආර්ථික අගය පිළිබඳ ප්‍රකාශනය

වර්තමාන ව්‍යාපාරික සන්දර්භය තුළ ආයතනික සමාජ වගකීම් තවදුරටත් ස්වේච්ඡා ක්‍රියාකාරකමක් ලෙස නොසලකයි. විශේෂයෙන් සංචාරක අංශයේ සේවාදායකයින් පරිසරය කෙරෙහි අවධානය යොමු කරමින් සමාජ වගකීමක් ඇති ආයතන පිළිබඳ සොයා බැලීම සහ අනුග්‍රහය දැක්වීම සිදු කරයි.

SLCB සමාජ වගකීම් සහිත ආයතනයක් ලෙස 2021 සඳහා පහත වැඩසටහන් පවත්වා ඇත:

- රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ ගුවන් සේවා, ව්‍යාපාරික මණ්ඩල සහ සංගම්, ගමනාන්ත කළමනාකරණ සමාගම්, වෘත්තීය සම්මන්ත්‍රණ සංවිධායකයින්, වැඩසටහන් කළමනාකරණ සමාගම්, රාජ්‍ය නිලධාරීන් සහ උසස් අධ්‍යාපන ආයතන ඇතුළු පාර්ශ්වකරුවන්ගේ විවිධ අංශ දැනුවත් කිරීම සඳහා "MICE පිළිබඳ SLCB සභාපතිගේ සංසදය" නමින් MICE සංසද පහක් සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය හෝටල් හිමියන්ගේ ප්‍රයෝජනය සඳහා "MICE UP, ශ්‍රී ලංකාවේ MICE සංචාරක ව්‍යාපාරය නැවත අර්ථ දැක්වීම" යන තේමාව යටතේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි අතථ්‍ය පුහුණු වැඩසටහන.
- "එක්ස්ප්ලෝ 2021" යන තේමාව යටතේ කොළඹ සිට බේරුවල දක්වා සහ කොළඹ සිට වයික්කාල දක්වා ප්‍රදේශවල පිහිටා ඇති නවතම සහ අද්විතීය MICE ස්ථාන පිළිබඳ පළමු අතථ්‍ය හුරුපුරුදු චාරිකාව සංවිධානය කරන ලදී.
- "MICE සංචාරකයින් සහ කණ්ඩායම් පිළිගැනීමට ශ්‍රී ලංකාව සුදානම්ල යන්න ඉස්මතු කිරීම සඳහා ප්‍රධාන වෙළඳපළවල වෙබිනාර් මාලාවක් පවත්වන ලදී - නවදිල්ලිය, මුම්බායි සහ බංග්ලාදේශය.
- කොවිඩ්-19 සංචාරක සීමා කිරීම් හේතුවෙන් ඉන්දියාවේ සිට තෝරාගත් MICE ගැනුම්කරුවන්ට කොළඹ MICE ස්ථාන සහ ආකර්ෂණීය ස්ථාන නිර්මාණාත්මකව ප්‍රදර්ශනය කරන ලදී. SLCB විසින් 2022 වර්ෂයේදී සියලුම සහභාගිවන්නන් සඳහා භෞතික FAM සංචාරයක් පිරිනමන ලදී.
- කොවිඩ්-19 සංචාරක සීමා කිරීම් හේතුවෙන් සහ මීළඟ MICE ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව තබා ගැනීම සඳහා පළමු අතථ්‍ය "ශ්‍රී ලංකා MICE Expo 2021" දියත් කරන ලදී. SLCB මාර්ගගත රැස්වීම් වේදිකාව හරහා දේශීය MICE කර්මාන්තයේ සහභාගිවන්නන් හමුවීමට ලියාපදිංචි ජාත්‍යන්තර ගැනුම්කරුවන් 450 කට අධික සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට සමත් විය.

6. 2021 මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2021.12.31 දිනට

	සටහන	2020 අයවැය රු.	2020 අයවැය රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	15	43,831,906	142,921,242
ලැබිය යුතු දෑ	16	38,644,799	31,107,992
පෙර ගෙවීම්	17	554,286	1,987,970
තොග	18	3,706,055	3,747,097
තැන්පතු	20	82,000	80,000
කෙටි කාලීන ස්ථාවර තැන්පතු		157,146,562	85,509,747
මුළු ජංගම වත්කම්		**243,965,609**	**265,354,048**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	19	3,619,417	3,614,240
දීර්ඝ කාලීන ආයෝජන	21	132,000,000	100,000,000
මුළු ජංගම නොවන වත්කම්		**135,619,417**	**103,614,240**
මුළු වත්කම්		**379,585,026**	**368,968,288**
බැරකම්			
ජංගම බැරකම්			
ණය හිමියන් සහ උපචිත වියදම්	22	2,282,074	5,486,496
මුළු ජංගම බැරකම්			
දීර්ඝ කාලීන බැරකම්			
විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		4,368,780	3,681,530
මුළු දීර්ඝ කාලීන බැරකම්			
මුළු බැරකම්		**6,650,854**	**9,168,026**
ශුද්ධ වත්කම්		372,934,172	359,800,262
ශුද්ධ වත්කම් / හිමිකම්			
දායක ප්‍රාග්ධනය		10,457,784	10,457,784
සමුච්චිත අතිරික්තය / ඌනතාවය	23	362,476,388	349,342,479
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්		**372,934,172**	**359,800,262**

සකස් කරන ලද්දේ
සහකාර කළමනාකරු - ගිණුම්
රන්සිකා පෙරේරා

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 22.03.2022 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

කෘෂාන්ත ප්‍රනාන්දු
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

ධම්මිකා කේ. විජේසිංහ
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

කිමාලි ප්‍රනාන්දු
සභාපතිනි
ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

සුනිල් දිසානායක
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

2021 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

	සටහන	2021 සත්‍ය රු.	2021 අයවැය රු.	2020 සත්‍ය රු.	2020 අයවැය රු.
ආදායම					
ආගමන බදු		19,359,129	11,763,185	19,580,140	24,594,643
සංචාරක සංවර්ධන බදු		32,638,821	22,187,488	21,624,709	11,573,950
වෙනත් ආදායම්	6	11,183,884	16,500,000	18,570,548	18,000,000
මුළු ආදායම		**63,181,833**	**50,450,673**	**59,775,397**	**54,168,593**
වියදම්					
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	7	20,550,236	23,620,000	20,827,889	22,025,000
සැපයුම් සහ පාරිභෝගික භාවිතයන්	8	5,999,884	7,580,000	5,218,389	5,880,000
අළෙවිකරණය හා සම්බන්ධ වියදම්	9	16,263,717	23,700,000	47,042,237	73,476,000
පර්යේෂණ සහ සංවර්ධන	10	2,674,035	3,375,000	604,031	4,225,000
දේශීය හා ජාත්‍යන්තර සංගමය සමඟ සම්බන්ධ වීම	11	3,062,906	5,000,000	5,592,701	12,000,000
ක්ෂය සහ ක්ෂය වෙන් කිරීමේ වියදම්	12	624,345	-	1,189,842	-
වෙනත් වියදම්	13	864,750	1,200,000	1,177,545	1,000,000
මූල්‍ය පිරිවැය	14	8,050	20,000	15,215	20,000
මුළු වියදම්		**50,047,923**	**64,495,000**	**81,667,848**	**118,626,000**
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාවය)		**13,133,911**		**(21,892,451)**	

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2021 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	2021 රු.	2021 රු.	2020 රු.	2020 රු.
ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)		13,133,911		(21,892,451)
ගැලපීම්				
ක්ෂයවීම් / ක්‍රමක්ෂය	624,345		1,189,842	
බැහැර කිරීමේ ඉපැයීම්	(5,025)		(1,120,000)	
පොලී ආදායම	(9,370,844)		(12,874,615)	
පාරිතෝෂික සඳහා ගෙවීම්	687,250	(8,064,274)	667,609	(12,137,164)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් මුදල් ප්‍රවාහය		5,069,637		(34,029,615)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම				
ඉවෙන්ටරි (වැඩිවීම) / අඩුවීම	41,041		(548,870)	
ලැබිය යුතු දෑ (වැඩිවීම) / අඩුවීම	(12,032,811)		(9,260,736)	
පෙර ගෙවීම් (වැඩිවීම) / අඩුවීම	1,783,683		31,712,751	
අත්තිකාරම් (වැඩිවීම) / අඩුවීම	(350,000)			
උපචිත බැර (වැඩිවීම) / අඩුවීම	(3,315,348)	(13,873,435)	(6,676,232)	15,226,913
මෙහෙයුම්වලින් උත්පාදනය කරන ලද මුදල්		(8,803,798)		(18,802,702)
පාරිතෝෂික ගෙවීම්	-	-	(2,685)	(2,685)
		(8,803,798)		(18,805,387)
ආයෝජන ක්‍රියාකාරකම්				
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(624,500)		(15,800)	
දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්	-		1,995,000	
ලැබූ පොලී ආදායම	13,977,776		13,972,560	
තැන්පතු	(103,638,814)	(90,285,539)	(50,000,000)	(34,048,240)
මූල්‍ය ක්‍රියාකාරකම්				
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
මුදල් සහ මුදල් හා සමාන දෑවල ශුද්ධ වෙනස් වීම		(99,089,337)		(52,853,627)
2021.01.01 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ		142,921,242		195,774,869
2021.12.31 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ		**43,831,906**		**142,921,242**

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

ශුද්ධ වත්කම් / සමකොටස්වල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

පාලක ආයතනයේ හිමිකරුවන්ට ආරෝපණය කළ හැකි	සටහන්	දායක ප්‍රාග්ධනය රු	සමුච්චිත අතිරික්තය / (ඌනතාවය) රු	මුළු ශුද්ධ වත්කම් / සමකොටස් රු
2020 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය	**23**	10,457,784	371,234,929	
2019 වර්ෂයට ලාභය			(21,892,452)	
2020 වර්ෂයට ලාභය			13,133,911	
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය ඉදිරියට ගෙන ගිය		**10,457,784**	**362,476,388**	**372,934,172**

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

ගිණුම් සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

01 සාමාන්‍ය තොරතුරු

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය (SLCB)

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ ස්ථාපිත කර ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත. කාර්යාංශයේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන මෙහෙයුම් කාර්යාලය, අංක. 78, හෝටල් පාසල් ගොඩනැගිල්ල, 4 වැනි මහළ, ගාලූ පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය විසින් සම්මේලන, ඒකාබද්ධ රැස්වීම්, දිරිගැන්වීමේ සංචාර සහ ප්‍රදර්ශන ප්‍රවර්ධනය කිරීමේ කටයුතු සිදු කරනු ලබයි.

02 සකස් කිරීමේ පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූල වන පරිදි ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇත. ආදායම සහ පිරිවැය, ඒවා අදාල වන කාල පරිච්ඡේදය සඳහා වන ගිණුම්කරණ ප්‍රකාශනවල උපචිත පදනමින් වාර්තා කර ඇත. යෝග්‍ය තැන්වලදී, සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති තදනන්තර සටහන්වල විස්තර කර ඇත. ගිණුම් සඳහා බලපෑම් ඇති කරනු ලබන උද්ධමනීය සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

03 දේපල, පිරියත සහ උපකරණ

සියලු දේපල, පිරියත සහ උපකරණ, මිලදීගත් පිරිවැයට හෝ ඉදිකිරීම් පිරිවැයට වන ඓතිහාසික පිරිවැයට ගණනය කර ඇත.

ක්ෂයවීම්, හිමිකාරිත්වය පැවති කාලපරිච්ඡේදයට අදාලව පිරිවැයට දක්වා ඇත. ක්ෂය අනුපාතික පහත දක්වා ඇත.

වත්කම්	අනුපාතිකය
කාර්යාල උපකරණ	10%
මෝටර් වාහන	25%
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	10%

04 බැරකම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍ර දිනට අදාළ සියලු ප්‍රමාණාත්මක බැරකම් ගිණුම්වල ඇතුලත් කර ඇත.

05 විශ්‍රාම ප්‍රතිලාභ

1983 අංක 12දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම සඳහා වෙන් කිරීම් සිදු කර ඇත. අඛණ්ඩ සේවා කාලයේ සෑම වර්ෂයක් සඳහාම වර්තමාන වැටුපෙන් අර්ධයක් වන පදනමින් අවසාන ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ. කෙසේවෙතත්, වර්ෂ 5 ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් වගකීම පැන නගී.

06 වෙනත් ආදායම්

අයිතමය	සත්‍ය 2021 (රු)	අයවැය (රු) 2021	සත්‍ය 2020 (රු)	අයවැය (රු) 2020
කාර්ය මණ්ඩල ණයපොළී ආදායම	63,424	70,000	51,542	60,000
සහභාගිවීමේ ගාස්තු	-	500,000	80,000	1,500,000
ඇමතුම් තැන්පතු පොළී	9,370,844	12,000,000	12,874,616	12,000,000
වෙනත් ආදායම්	1,749,615	3,930,000	5,564,390	4,440,000
එකතුව	**11,183,884**	**16,500,000**	**18,570,548**	**18,000,000**

07 වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ

අයිතමය	සත්‍ය 2021 (රු)	අයවැය (රු) 2021	සත්‍ය 2020 (රු)	අයවැය (රු) 2020
කාර්ය මණ්ඩල වැටුප්	12,155,905	12,300,000	12,083,613	11,900,000
අතිකාල / අනියම් සේවක වැටුප් සහ වෙනත් දීමනා	45,400	80,000	258,062	250,000
සභාපතිවරයාගේ දීමනා	-	1,200,000	-	-
සභාපතිවරයාගේ ඉන්ධන සහ වාහන කුලී	-	900,000	-	-
කාර්ය මණ්ඩල අතිකාල දීමනා	10,352	20,000	39,728	50,000
සේවක අර්ථසාධක අරමුදල	1,717,186	1,700,000	1,711,372	1,300,000
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	343,437	400,000	342,275	700,000
කාර්ය මණ්ඩල සෞඛ්‍ය රක්ෂණය	1,456,776	2,000,000	-	-
කාර්ය මණ්ඩල සුබසාධනය	265,044	400,000	1,659,964	3,000,000
ශ්‍රී ලංකා සංචාරක සඳහා දායකත්වය	30,705	100,000	-	100,000
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	30,523	45,000	31,448	45,000
දේශීය ගමන්	64,602	75,000	53,488	75,000
පාරිතෝෂික	687,250	-	667,609	-
පැමිණීමේ දිරි දීමනා	428,323	600,000	379,430	600,000
කාර්ය මණ්ඩල පුහුණුව	173,000	200,000	63,900	300,000
කාර්ය මණ්ඩල ප්‍රවාහනය සහ ඉන්ධන දීමනා	3,136,000	3,600,000	3,537,000	3,705,000
පෙර වර්ෂයේ ගැලපීම	5,732	-	--	
	20,550,236	**23,620,000**	**20,827,889**	**22,025,000**

08 භාවිතා කළ සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය

අයිතමය	සත්‍ය 2021 (රු)	අයවැය (රු) 2021	සත්‍ය 2020 (රු)	අයවැය (රු) 2020
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	794,611	1,000,000	1,039,412	800,000
දුරකථන	1,004,702	900,000	881,883	750,000
තැපැල් සහ කුරියර් ගාස්තු	10,420	30,000	23,318	30,000
සාමාන්‍ය කාර්යාලීය වියදම්	916,385	600,000	496,128	900,000
රක්ෂණ - ශ්‍රී ලංකා සම්මේලන ආයතනයේ වාහන	60,998	100,000	58,610	250,000
කාර්යාලය නඩත්තු කිරීම	163,564	500,000	453,879	500,000
වාහන ඉන්ධන	36,621	150,000	99,812	150,000
වාහන අලුත්වැඩියා / නඩත්තු	30,880	600,000	557,395	300,000
විවිධ	86,271	200,000	97,653	200,000
කාර්යාල කුලී	1,411,512	2,000,000	1,510,300	2,000,000
වාහන කුලී	1,483,920	1,500,000	-	-
එකතුව	**5,999,884**	**7,580,000**	**5,218,389**	**5,880,000**

09 අළෙවිකරණ සම්බන්ධිත වියදම්

අයිතමය	සත්‍ය 2021 (රු)	අයවැය (රු) 2021	සත්‍ය 2020 (රු)	අයවැය (රු) 2020
විදේශ ප්‍රවර්ධන / පොළවල්	-	-	35,364,544	40,396,000
මුද්‍රණය / නිෂ්පාදනය	4,660,792	5,300,000	6,351,638	13,300,000
වෙළඳ දැන්වීම්	412,950	2,250,000	-	1,200,000
බෙව් අඩවි ප්‍රවර්ධන	3,163,372	4,100,000	943,480	7,080,000
වැඩසටහන් සඳහා සහාය	778,738	2,500,000	4,074,425	6,000,000
හුරුපුරුදු කිරීමේ සංචාර	785,007	2,500,000	-	-
විශේෂ ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම්	6,462,858	7,050,000	308,149	5,500,000
එකතුව	**16,263,717**	**23,700,000**	**47,042,237**	**73,476,000**

10 පර්යේෂණ සහ සංවර්ධන

අයිතමය	සත්‍ය 2021 (රු)	අයවැය (රු) 2021	සත්‍ය 2020 (රු)	අයවැය (රු) 2020
හෝටල් සඳහා ප්‍රාදේශීය MICE පුහුණුව	350,000	350,000	523,041	3,875,000
MICE පුහුණු / දැනුම්වත් කිරීමේ වැඩසටහන නිර්මාණය කිරීම	1,350,000	1,550,000	-	-
MICE සඳහා හුරුපුරුදු කිරීමේ වැඩසටහන	386,640	500,000	77,490	100,000
MICE ගැනුම්කරුවන්ගේ දත්ත සමුදාය	5,792	75,000	3,500	150,000
ලංසු තැබීම, ලංසු සහය	-	250,000	-	100,000
වාර්ෂික වාර්තා මුද්‍රණය	581,603	650,000	-	-
එකතුව	**2,674,035**	**3,375,000**	**604,031**	**4,225,000**

11 දේශීය හා ජාත්‍යන්තර සංගම් සමඟ සම්බන්ධ වීම

අයිතමය	සත්‍ය 2021 (රු)	අයවැය (රු) 2021	සත්‍ය 2020 (රු)	අයවැය (රු) 2020
අයිසීසීඒ සාමාජිකත්වය සහ සම්බන්ධිත ක්‍රියාකාරකම්	763,090	2,000,000	3,525,436	6,000,000
සංගම් වැඩසටහන්	480,600	2,000,000	1,810,265	4,000,000
වෙනත් සංගම් හා සම්බන්ධ ක්‍රියාකාරකම්	1,819,217	1,000,000	257,000	2,000,000
එකතුව	**3,062,906**	**5,000,000**	**5,592,701**	**12,000,000**

13 වෙනත් වියදම්

අයිතමය	සත්‍ය 2021 (රු)	අයවැය (රු) 2021	සත්‍ය 2020 (රු)	අයවැය (රු) 2020
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	714,750	500,000	518,850	500,000
වෘත්තීය ගාස්තු	150,000	700,000	658,695	500,000
එකතුව	**864,750**	**1,200,000**	**1,177,545**	**1,000,000**

14 මූල්‍ය පිරිවැය

අයිතමය	සත්‍ය 2021 (රු)	අයවැය (රු) 2021	සත්‍ය 2020 (රු)	අයවැය (රු) 2020
බැංකු ගාස්තු	8,050	20,000	15,215	20,000
එකතුව	**8,050**	**20,000**	**15,215**	**20,000**

15 අතැති සහ බැංකුවේ ඇති මුදල්

අයිතමය	2021 (රු)	2020 (රු)
බැංකුවේ ඇති මුදල් - ලංකා බැංකුව	(1,861,137)	498,959
බැංකුවේ ඇති මුදල් - මහජන බැංකුව	46,371	22,189,440
ලංකා බැංකු අරමුදල කළමනාකරණ හිණුම	45,646,671	120,232,843
අතැති සහ බැංකුවේ ඇති මුදල් එකතුව	**43,831,906**	**142,921,242**

16 ලැබිය යුතු දෑ

අයිතමය	2021 (රු)	2020 (රු)
කාර්ය මණ්ඩල ණය	1,397,516	1,286,589
වෙනත් ලැබිය යුතු දෑ - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	31,997,283	19,964,471
ඇමතුම් තැන්පතු සහ ලැබිය යුතු පොලී	5,250,000	9,856,932
එකතුව	**38,644,799**	**31,107,992**

17 පෙර ගෙවීම්

අයිතමය	2021 (රු)	2020 (රු)
ප්‍රවර්ධන සඳහා ගෙවීම්	101,018	101,018
රක්ෂණ	11,399	5,854
පෙරගෙවුම් - MICE ගැනුම්කරු දත්ත සමුදාය	60,208	101,881
කාර්යාල උපකරණ නඩත්තුව	21,661	-
උත්සව අත්තිකාරම්	350,000	-
වෙබ් අඩවි නඩත්තු පෙර ගෙවීම්	10,000	10,000
අයිසීසීඒ සංගම් සාමාජිකත්වය	-	1,769,217
එකතුව	**554,286**	**1,987,970**

18 2021.12.31 දිනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය ආයතන තොග-මිලදී ගත් වටිනාකම හෝ වෙළඳපළ වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මත පදනම් වේ.

අයිතම අංකය	2020.12.31 දිනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය තොග	මුළු වටිනාකම රු
1	දිරිගැන්වීමේ අත් පත්‍රිකාව	51,840
2	රැස්වීම් සැලසුම්කරු	23,205
3	MICE ක්‍රියාකාරකම් අත් පත්‍රිකාව	163,172
4	හම්බන්තොට අත් පත්‍රිකාව	152,670
5	MICE අත් පත්‍රිකාව	64,467
6	පෝසිලේන් පෝගු	770
7	රාමායනය සඟරා	62,574
8	කඩදාසි මලු	41,770
9	ස්ටිකර්	14,368
10	පෙන් ඩ්‍රයිව්	1,183,092
11	ඔතන කඩදාසි	128,688
12	භාජන තැබීම සඳහා මේසය මත තබන කුඩා කලාල	957,630
13	ප්‍රවර්ධන මලු	861,810
		3,706,055

20 තැන්පතු

අයිතමය	2021 (රු)	2020 (රු)
ශ්‍රී ලංකා ටෙලිකොම්	5,000	5,000
සී.එෆ්. ද මෙල් සහ පුත්‍රයෝ	75,000	75,000
ඇමෙරිකන් ප්‍රීමියම්	2,000	-
එකතුව	**82,000**	**80,000**

21 දීර්ඝ කාලීන ආයෝජන

අයිතමය	2021 (රු)	2020 (රු)
මහජන බැංකු ස්ථාවර තැන්පතු	132,000,000	100,000,000
එකතුව	**132,000,000**	**100,000,000**

22 ණය හිමියන් සහ උපචිත වියදම්

අයිතමය	2021 (රු)	2020 (රු)
කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු	485,851	632,121
වෙනත් ගෙවිය යුතු - ඒෂියන් ඇඩ්වෙන්චර්ස් 2018	90,000	90,000
ක්ලීන් ෆෝර්ස්	27,676	27,676
ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ්	2,876	2,028
මොබිටෙල් පෞද්ගලික සමාගම	15,366	10,874
SLTDA - මෝටර් රථ කුලියට ගැනීමේ ගාස්තු	61,830	185,490
ශ්‍රී ලංකා ටෙලිකොම්	22,248	10,621
ඇමරිකන් ප්‍රීමියම්	6,884	2,298
SLTDA - නිකේතන	5,411	5,045
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල	240,621	239,688
ශ්‍රී ලංකා ටෙලිකොම් 2440002	11,260	-
ගෙවිය යුතු සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල	28,875	28,762
ශ්‍රී ලංකා වෘත්තීය සම්මේලන සංගමය	600,000	-
ගෙවිය යුතු විගණන ගාස්තු	546,000	792,000
SLITHM - කෙටි කෑම / බීම	2,250	660,000
SLTDA - ICT	129,807	-
ගල්කිස්ස හෝටලය	5,120	-
සැලසිනෙ ආයතනය	-	488,579
ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය	-	1,810,265
ලංකා ඒඑන් ග්ලෝබල්	-	335,000
හෝම්ස් පොලාඩ්	-	165,000
ගෙවිය යුතු මුද්දර ගාස්තු		1,050
එකතුව	**2,282,074**	**5,486,496**

12 & 19 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

සටහන	කේතය	විස්තරය	2021.01.01 දිනට ශේෂය	2020 එකතු කිරීම	2021.12.31 දිනට ශේෂය	2021.01.01 දිනට සමුච්චිත ක්‍රමක්ෂය	2021.12.31 දිනට ක්‍රමක්ෂය	2021.12.31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය	2021.12.31 දිනට ශුද්ධ පොත් අගය
3.1	101	කාර්යාල උපකරණ	3,908,936	624,500	4,533,436	1,524,847	417,898	1,942,745	2,590,691
3.3	103	ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	1,987,115	1,200	1,988,315	837,964	193,625	1,031,589	956,726
3.4	110	මෝටර් වාහන	-	-	-	-	-	-	-
3.5	111	මෘදුකාංග	90,000	-	90,000	9,000	9,000	18,000	72,000
		උප එකතුව	**5,986,051**	**625,700**	**6,611,751**	**2,371,811**	**620,523**	**2,992,334**	**3,619,417**

23 සමුච්චිත අතිරික්තය / ඌනනය

	දායක ප්‍රාග්ධනය	සමුච්චිත අතිරික්තය/ ඌනනය	මුළු ශුද්ධ වත්කම් සම කොටස්
2020 ජනවාරි 1 වන දිනට ශේෂය, ඉදිරියට ගෙන ගිය	10,457,784	371,234,929	
2020 වර්ෂය සඳහා ලාභය		(21,892,452)	
2021 වර්ෂය සඳහා ලාභය		13,133,911	
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය, 2020 ඉ/ගෙ	**10,457,784**	**362,476,388**	**372,934,172**

SRI LANKA CONVENTION BUREAU

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } විඅයිපි/ඒ/එස්එල්සීබී/05/21/එෆ්ඒ

ඔබගේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 ජූනි 23 දින

සභාපති
ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරපත් නොකළ යුතු වුව ද, සමාලෝචන වර්ෂය අවසානයට පැවති මුදල් ශේෂයෙන් රු. 1,861,137 ක් වූ බැංකු අයිරාව හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ශේෂය, එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 2018 වර්ෂය වනවිට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.6,700,000 ක් වූ මෝටර් රථයක ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්යාංශයේ ගිණුම් අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල් වටිනාකම ලෙස රු.31,997,283 ක් ලෙස දක්වා තිබුණ ද, අධිකාරියේ ගිණුම් අනුව ඊට අනුරූපිව ගෙවිය යුතු මුදලක් ද දක්වා නොතිබුණි. ඒ අනුව මෙහි ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් අතර රු.31,997,283ක වෙනසක් නිරීක්ෂණය වුවද වෙනස්කම් පිළිබඳව සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කාර්යාංශයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය

තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාංශය විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාංශය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව		නිරීක්ෂණ
(අ)	2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනතේ VIII වන පරිච්ඡේදයේ 42(2) වගන්තියේ (ආ),(ඉ) සහ (ඌ) උපවගන්ති	සංචාරක වෙළඳපලෙහි ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදුකිරීමට වගබලා ගැනීම සඳහා සැලසුම් කල පොදු ප්‍රතිපත්තියක් ඇතිකර ගැනීම, සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන ආදී වැඩසටහන් වල නිරත තැනැත්තන්ට සහ සංවිධාන වලට වෘත්තීමය ප්‍රමිති නියම කිරීම සහ ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන කාර්යාංශයට මගපෙන්වීම ලබාදීම යන පරමාර්ථ සමාලෝචිත වර්ෂය දක්වා කාර්යාංශය විසින් ඉටුකර නොතිබුණි.
(ආ)	1971 අංක 38 දරන මුදල් පනත	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.118,000,000 ක කෙටිකාලීන ආයෝජන සහ රු. 32,000,000 ක දිගුකාලීන ආයෝජන වල 2020 සහ 2021 වර්ෂයන්හිදී ආයෝජනය කර තිබුණි.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIIපරිච්ඡේදයේ 1.7 ඡේදය	අනුමත කරන ලද නිවාඩු පිළිබඳ රෙජිස්ටරයක් 190 වැනි පොදු ආකෘති පත්‍රය අනුව තබාගත යුතුවුවත්, කාර්යාංශය විසින් නිවාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති



ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය
இலங்கை இணக்கப்பாட்டுப் பணியகம்
SRI LANKA CONVENTION BUREAU

4 වන මහල, හෝටල් පාසල් ගොඩනැගිල්ල, අංක. 78, ගාලු පාර, කොළඹ 03
4 ஆம் மாடி, ஹோட்டல் பாடசாலை கட்டிடம், இல. 78, காலி வீதி, கொழும்பு 03
4th Floor, Hotel School Building, No. 78, Galle Rd, Colombo 03

දුරකතන / தொலைபேசி / Telephone : + 94 11 4865050 /1 2440002
ෆැක්ස් / தொலைநகல / Fax : + 94 11 2472985
විද්‍යුත් ලිපිනය / மின்னஞ்சல் முகவரி / Email address : slcb@srilanka.travel
වෙබ් අඩවිය / இணைய முகவரி / Web address : www.meetinsrilanka.com